# ගනේගොඩ රජමහා විහාරය පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

කේ.එම්.එස්. සෙනෙවිරත්න[14]

---

ගනේගොඩ රජමහ විහාරය ජනශ්‍රැතියට අනුව වලගම්බා රජු සැඟවී සිටි ස්ථානයක් ලෙස සැළකුවද මූලාශ්‍රගත තොරතුරුවලට අනුව ගම්පොල යුගයේ විසූ ධර්මකීර්ති හිමියන් විසින් නිර්මාණය කරන ලද ලෙන් විහාරයක් ලෙස සැළකේ. මෙම ලෙන් විහාරය පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී සාහිත්‍ය මූලාශ්‍රයන් ප්‍රධාන කොට සැළකිය හැකි අතර ස්ථානය ගවේෂණය ද වැදගත් වේ. මෙම විහාර නිර්මාණය තුළ දක්ෂිණ භාරතීය දේව ලක්ෂණ, ගඩලාදෙණි හා ලංකාතිලක විහාරයන්හි පිළිමවල ලක්ෂණ හා යාපහුව ගල් කැටයම්වල ලක්ෂණ විහාර දක්‍ගත හැකි වේ. බුලත්කොහුපිටිය - කෑගල්ල මාර්ගයේ අලවතුර ගනේගොඩ ග්‍රාමයේ පිහිටා තිබෙන මෙම විහාරය භූමියට පිවිසීම උදෙසා පියගැට 250කට ආසන්න සංඛ්‍යාවක් නැගිය යුතු වේ. විහාර භූමියට පිවිසිමෙන් අනතුරුව කොටස් දෙකකට බෙදී ඇති විහාර දක ගත හැකි වේ. එම කොටස් දෙක වන්නේ, ස්භාවික ගල්ලෙන ඉදිරියෙන් තනා ඇති ආලින්දය සහිත පෝටිකෝව සහ නියම ගල්ලෙන් විහාරයයි. ස්භාවික ගල්ලෙන් විහාරයට ජලය කාන්දු නොවීම උදෙසා එහි ඉහල ධාරයෙන් බේරන ලද කටාරයකින් යුක්ත වේ. ගනේගොඩ ලෙන් විහාරයේ අලංකාර මල් ලිය හා වාමණ කැටයම්වලින් සැරසූ කුළුණු ද එම කුළුණුවල ඍජු කෝනාස්‍ර රාමුවක් තුළ බුදු පිළිම හෝ බෝසත් පිළිම කැටයම් කර තිබීම සුවිශේෂී වේ. එමෙන්ම පිළිමගෙට ගොඩවන පියගැටපෙළ දෙපස තිබෙන කොරවක්ගල් දෙක ද විශිෂ්ට වේ. කළුගල් වේදිකාවක් මත ගොඩනගන ලද මෙම විහාරයේ පිළිමගෙට ඇතුළුවීමට ද්වාර දෙකක් තිබී ඇත. ඒ අනුව කොරවක්ගල් දෙක පසු කර පැමිණෙන ද්වාරය ප්‍රධාන දොරටුව ලෙස සැළකෙන අතර එහි දී පිළිමගෙයට ඇතුළුවීමේ දී ගලින් කරන ලද උළුවැස්සක් හා ගලින් කරන ලද සිවිලිමක් ද දක්‍ගත හැකි වේ. අනතුරුව මැටියෙන් තැනූ මකර තොරණ මධ්‍යයෙහි කළු ගලින්ම නිම කරන ලද හිඳි බුදුපිළිමය දක්‍ගත හැකිය. විහාරගෙයි සෑම බිත්තියක්ම විවිධ වූ චිත්‍රවලින් අලංකාර කර තිබීම ද සුවිශේෂී කොට සැළකිය හැකි වේ. ගනේගොඩ විහාරයේ පාදම කොටසේ ගලින් කරන ලද රූකම් සුවිශේෂී නිර්මාණයන් වේ. බෙල් මහතාට අනුව කෑගල්ල දිස්ත්‍රික්කයේ ඔහු දුටු එකම ගල් ලෙන් විහාරය මෙය ලෙස සැළකේ. ඓතිහාසික වශයෙන් වැදගත් මෙම විහාරස්ථානය පුරාවිද්‍යාත්මක අධ්‍යනයක් සඳහා වැදගත් ලෙන් විහාරස්ථානයක් ලෙස නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පදඃ ගල්ලෙන, පිළිම, පෝටිකෝව

---

[14]මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය,ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.